**ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පීඑල්සී (සමාගම) සහ එහි පරිපාලිතය - 2019**
---

**1.1 මතය**

2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශ ගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පීඑල්සී (“සමාගම”) හි මූල්‍ය ප්‍රකාශන සහ සමාගමේ හා එහි පරිපාලිතයේ (“සමූහය”) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය සිදු කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහය මා ලබා ගන්නා ලදී.

සමාගමේ සහ සමූහයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන මගින් හා සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝවෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ හා සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන ඇපවීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

විගණනයේ කොටසක් ලෙස මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමූහයේ හා පරිපාලිතයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් යොදාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය ඇගයීම හා ගිණුම්කරණ ඇස්තමේන්තු හා සම්බන්ධිත හෙළිදරව්කිරීම් වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් මාගේ විගණකගේ වාර්තාවේ දින තෙක් ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීම්ද ඇතුළත්ව ඉදිරිපත් කිරීම, ව්‍යුහය හා අන්තර්ගතය ඇගයීම සහ පාදක වූ මූල්‍ය ප්‍රකාශන වල ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වන අයුරින් ඉදිරිපත් කර ඇති බව.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාල ලිඛිත නීතියකට හෝ සමූහයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව,සමූහය ක්‍රියා කර ඇති බව.

- සිය බලතල, කර්තව්‍ය හා කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 සුදුසු නොවන අගය කිරීම හෝ තක්සේරුකරණය

| විගණන ගැටලුව | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2001 දී මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා සමඟ තිබූ කොටස් කළඹ අවසන් කිරීමෙන් පසු සමාගමට පහත සඳහන් සමාගම් වලින් ප්‍රසාද කොටස් ලැබී තිබේ. මෙම කොටස් 2019 දෙසැම්බර් 31 දින වන විට එම කොටස් වල සාධාරණ අගය සැලකිල්ලට නොගෙන ඒවායේ මූලික පිරිවැය යටතේ සටහන් වූ ඒවා වේ.<br>සමාගම — කොටස් සංඛ්‍යාව<br>ආසිරි හොස්පිටල්ස් හෝල්ඩින්ග්ස් පීඑල්සී — 30<br>සෙලින්කෝ ඉන්ෂුවරන්ස් පීඑල්සී — 26<br>හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී — 18 | පසුව ප්‍රකාශයට පත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල, එනම් 2020 මාර්තු 31 න් අවසන් කාර්තුව සඳහා අන්තර් මූල්‍ය ප්‍රකාශනවල එකී කොටස් සාධාරණ අගය කිරීම සඳහා දැනටමත් පියවර ගෙන ඇත. 2019 දෙසැම්බර් 31 වන විට එකී කොටස්වල සාධාරණ වටිනාකම රු. 55,359 කි. | වාර්තා කරන දිනට ප්‍රසාද කොටස් සාධාරණ වටිනාකමකින් සටහන් කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදිය කෙරෙහි අනුගත නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියේ යොමුව | අනුගත නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත | සමාගම සේ.අ.අ සහ සේ.නි.භා.අ. ගණනය කිරීමේදී විධායක කාර්ය මණ්ඩලයේ මූලික වැටුප සඳහා මූලික දීමනාවන් ඇතුළත් කර නොතිබුණි. | කළමනාකාරීත්වය මේ සම්බන්ධයෙන් විගණන කමිටුවට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට ලිපියක් ඉදිරිපත් කරනු ඇත. | සේ.අ.අ සහ සේ.නි.භා.අ. ගණනය කිරීමේදී මූලික වැටුපට අදාළ වන සියලුම දීමනා ඇතුළත් කිරීමට නිර්දේශ කෙරේ. |

| | | | |
|---|---|---|---|
| කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත රීති අංක 7.13.1 (අ) | සියයට 20 අවම මහජන හිමිකාරිත්වයේ අවශ්‍යතාවට අනුගත වීමට සමාගමට නොහැකි වීම. | සුළුතර කොටස් හිමියන් සතුව ඇති කොටස් නැවත මිලදී ගැනීමට සහ සමාගම ඉවත් කිරීමට ඇති නෛතික ශක්‍යතාව සමාගම විසින් ඇගයීමට ලක් කරමින් සිටියි. | ඉවත් කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම නිර්දේශ කරනු ලැබේ. |

## 1.7 බදු රෙගුලාසි වලට අනුගත නොවීම

| | විගණන ගැටලුව | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂය තුළ සමාගම විසින් ආයෝජන දේපළේ පොකුණු ප්‍රදේශයට රු. 12,617,139 ක් එකතු කර ඇත. පවත්නා වර්ෂයේ ආදායම් බදු ගණනය කිරීමේදී ඉහත මුදල සඳහා ප්‍රාග්ධන දීමනාව සමාගම විසින් ඉල්ලා නොමැත. | 2019/2020 තක්සේරු වර්ෂය සඳහා අවසාන බද්ද ගෙවීමට පෙර ගොඩනැගිල්ලේ පොකුණු ප්‍රදේශය සඳහා ප්‍රාග්ධන දීමනා ලබාගෙන ඇත. | මූල්‍ය වර්ෂය සඳහා ගණනය කරන ලද ආදායම් බදු වගකීම්වල නිරවද්‍යතාවය සහතික කිරීම කළ යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 696,006,158 ක ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ලාභය රු. 497,794,653ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 198,211,505 ක වර්ධනයක් නිරීක්ෂණය විය. වර්ෂය තුළ කුලී ආදායම සියයට 13 කින් වැඩි වීම හා අනෙකුත් මූල්‍ය ආදායම සියයට 98 කින් වැඩි වීම මෙම වර්ධනය කෙරෙහි බලපෑ ප්‍රධාන හේතුව විය.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමයන්ගේ ප්‍රවනතා විශ්ලේෂණය

පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචනයට භාජනය වූ වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් අයිතම විශ්ලේෂණය වැඩි වීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය සමඟ පහත දැක්වේ.

| විස්තරය | විචල්‍ය අගය වැඩි වීම/ (අඩු වීම) (රු.) | විචලනය % | විචලනයට හේතුව |
|---|---|---|---|
| ආදායම | 95,759,573 | 13 | පෙර වසර හා සසඳන විට කුලී ආදායම සියයට 13 කින් වැඩි වී තිබේ. |
| වෙනත් මෙහෙයුම් ආදායම | 138,634,556 | 98 | ප්‍රාග්ධන වියදම් ප්‍රතිපූරණය කිරීම සඳහා රු. මිලියන 26 ක් ලංකා බැංකුවෙන් ලැබීම සහ පරිපාලිත සමාගමෙන් ලාභාංශ ආදායම ලෙස රු. මිලියන 159.8 ක් ලැබීම හේතුවෙනි. |
| මූල්‍ය ආදායම | 15,641,491 | 8 | පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ස්ථාවර තැන්පතු සහ ප්‍රතිමිලදී ගැනුම් ආයෝජන පිළිවෙලින් සියයට 22 කින් සහ සියයට 65 කින් ඉහළ ගොස් තිබුණි. |

### 2.3 අනුපාත විශ්ලේෂණය

විගණනය සඳහා ලබා දී ඇති මූල්‍ය ප්‍රකාශන හා තොරතුරු අනුව,සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂය සඳහා වූ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත පරිදි වේ.

| වර්ෂය | 2019 | 2018 |
|---|---|---|
| ශුද්ධ ලාභ අනුපාතය (ප්‍රතිශත) | 51.98 | 49.28 |
| මුළු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (ප්‍රතිශත) | 20.18 | 17.26 |
| ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය (ප්‍රතිශත) | 18.62 | 14.94 |
| ජංගම අනුපාතය (වාර ගණන) | 21:1 | 21:1 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණයේ අකාර්යක්ෂමතාවන්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ තොග සමන්විත වන්නේ වසර 1 කට වඩා වැඩි කාලයක් සඳහා දීර්ඝ කරන ලද අයිතම වලින් ය. සමහර භාණ්ඩ වසර 6 සිට 9 දක්වා කාලයක් ගබඩාවේ තබා ඇත. එම තොග යන්ත්‍රෝපකරණ අමතර කොටස් වන අතර ඒවා ප්‍රතිස්ථාපනය හෝ ඉවත් කරන තෙක් තබා තිබුණි. | අමතර කොටස් ආනයනය කිරීමට සති 8 -12 ක් ගතවන බැවින් ලංකා බැංකුවේ මෙහෙයුම් සඳහා අඛණ්ඩ සේවාවන් සැපයීම සහතික කිරීම සඳහා ප්‍රධාන පිරියත සහ උපකරණ සඳහා ඉතා වැදගත් අමතර කොටස් ගබඩා කිරීමට අපට බල කෙරී ඇත. සමහර ඉතා වැදගත් පිරියත සහ උපකරණවල අමතර කොටස් සඳහා අමතර කොටස් ආනයනය කිරීමට ගතවන කාලය මාස 04 දක්වා වැඩි විය හැකිය. | වරින් වර තොග මට්ටම සමාලෝචනය කිරීම සහ මන්දගාමී හා යල්පැනගිය තොග හඳුනා ගැනීම සඳහා විධිමත් ප්‍රතිපත්තියක් තිබීම නිර්දේශ කරනු ලැබේ. |

### 3.2 රීති සහ නියමයන් පිළිපැදීමට ප්‍රමාද වීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගම කොළඹ කොටස් වෙළඳපොලේ 7.13.1 ලැයිස්තුගත කිරීමේ රීතිවලට අනුකූල නොවීම හේතුවෙන් 2014 මාර්තු 21 වන දින සිය ලැයිස්තුගතයෙන් ඉවත් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදි. එය දැනටමත් වසර හයක් ඉක්මවා ගොස් ඇති අතර ලැයිස්තුගතයෙන් ඉවත් කිරීමේ තවමත් ක්‍රියාත්මක වෙමින් පවතී. | ලැයිස්තුගතයෙන් ඉවත් කිරීමේ ක්‍රියාවලිය 2014 මාර්තු මාසයේදී ආරම්භ කළද, ප්‍රධාන කොටස් හිමියා වන ලංකා බැංකුව (BOC) විසින් ඉහත ලැයිස්තුගත කිරීමේ රීතියට අනුකූල වීමට තීරණයක් ගැනීම සඳහා කාලය ගත කරන ලදී.<br>සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ 5 වන රීතිය යටතේ අවශ්‍ය පරිදි ලැයිස්තුගත කිරීම සඳහා කොටස් හිමියන්ගේ අනුමැතිය ලබා ගැනීම සඳහා සමාගම 2018 අප්‍රේල් 04 වන දින | ඉවත් කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා නිර්දේශ කෙරේ. |

| | | | |
|---|---|---|---|
| | | අතිවිශේෂ මහා සභා රැස්වීමක් කැඳවූ අතර සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ 5 වන රීතිය යටතේ අවශ්‍ය පරිදි ලැයිස්තුගතයෙන් ඉවත් කිරීම සඳහා කොටස් හිමියන්ගේ අනුමැතිය ලබා ගැනීමට එය සාර්ථක නොවීය.<br>සියළුම විකල්පයන් නැවත ඇගයීමෙන් පසු, සමාගම විසින් තමන්ගේම කොටස් මිලදී ගැනීමේ මාර්ගයෙන් ලැයිස්තුගතයෙන් ඉවත් කිරීමේ ක්‍රියාවලිය නැවත ආරම්භ කරන ලෙස ප්‍රධාන කොටස් හිමියා දැන් සමාගමට උපදෙස් දී ඇත.<br>සමාගම දැන් සුළුතර කොටස් හිමියන් සතුව ඇති කොටස් නැවත මිලදී ගැනීමට සහ සමාගම ලැයිස්තුගතයෙන් ඉවත් කිරීමට ඇති නෛතික ශක්‍යතාව තක්සේරු කරමින් සිටී. | |
| ආ | ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ 2017 නොවැම්බර් 20 දිනැති ලිපිය මගින්, බැංකුවේ මූලික ව්‍යාපාර කටයුතු වල විෂය පථයෙන් බැහැර වන්නා වූ කොලදෙනිය හයිඩ්‍රොපවර් (පුද්ගලික) සමාගමෙහි (ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පීඑල්සීහි පූර්ණ හිමිකාරීත්වය දරන පරිපාලිතයක් වන) හිමිකාරීත්වය ඉදිරි වසර තුන ඇතුළත ඉවත් කරන ලෙසට උපදෙස් දී තිබේ. මැතිවරණ සහ COVID 19 වසංගතය රට තුළ පැතිරීම හේතුවෙන් කළමනාකාරිත්වයට 2020 ජුනි මාසය වන තෙක් එම ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාමට නොහැකි විය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020 ජූලි 30 දින සිය ලිපියෙන් 2021 ජුනි 30 වන තෙක් නිරායෝජනය කිරීමේ ක්‍රියාවලිය අවසන් කිරීම සම්පූර්ණ කිරීමේ කාල සීමාව දීර්ඝ කර තිබේ. | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කරනු ලබන පරිදි, එම ආයෝජනය BOC හි ප්‍රධාන ව්‍යාපාරයට පිටින් පවතින බැවින්, 2020 නොවැම්බර් 20 වන විට KHP හි ආයෝජනය බැහැර කරන ලෙස 2018 මාර්තු 08 දිනැති ලිපියක් මගින් බැංකුවේ (BOC) සභාපති සමාගමට දැනුම් දුන්නේය.<br>කෙසේ වෙතත්, මැතිවරණ සහ රට තුළ COVID 19 වසංගතය පැතිරීම හේතුවෙන් 2020 ජුනි මාසය වන තෙක් කළමනාකාරිත්වයට මෙම ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාමට නොහැකි විය.<br>BOCහි 2020 අගෝස්තු 18 දිනැති ලිපිය මඟින්, 2020 ජූලි 30 දිනැති ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ලිපිය මගින් 2021 ජුනි 30 වන විට නිරායෝජනය කිරීමේ ක්‍රියාවලිය අවසන් කරන ලෙස සමාගමට දැනුම් දී තිබේ. | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරන ලද පරිදි කොලදෙනිය හයිඩ්‍රොපවර් (පුද්ගලික) සමාගම බැහැර කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමට නිර්දේශ කෙරේ. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

2019 දෙසැම්බර් 31 දින වන විට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කාර්ය මණ්ඩලය සහ සත්‍ය සේවක මණ්ඩලය අතර පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය කරන ලදී. 2020 ජනවාරි සහ මාර්තු මාසවලදී විධායක මට්ටමේ පුරප්පාඩු දෙකක් පිරවීමට සමාගමට හැකි විය.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

(අ) 2019 දෙසැම්බර් 31 දින වන විට සමාගමේ අනුමත කාර්ය මණ්ඩලය සහ සත්‍ය සේවක මණ්ඩලය අතර පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය කරන ලද අතර අවශ්‍ය බඳවා ගැනීම් සිදු කිරීමට සමාගම අවශ්‍ය පියවර ගෙන නොමැත.

| දෙපාර්තමේන්තුව | අනුමත කාර්ය මණ්ඩලය | 2019.12.31 දිනට සත්‍ය කාර්ය මණ්ඩලය | වෙනස |
|---|---|---|---|
| විධායක කාර්ය මණ්ඩලය | 15 | 11 | 04 |
| නඩත්තු දෙපාර්තමේන්තුව | 61 | 57 | 04 |
| මූල්‍ය දෙපාර්තමේන්තුව ගිණුම් අංශය | 09 | 07 | 02 |
| මානව සම්පත් හා පරිපාලන දෙපාර්තමේන්තුව | 16 | 14 | 02 |

**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම:**

ලබා දී ඇති දිනයන්හි පහත පුරප්පාඩු දැනටමත් පුරවා ඇත.

(i) 2020 ජනවාරි 01 දින ඉංජිනේරු සහකරුවකු බඳවා ගන්නා ලදී.

(ii) නඩත්තු ඉංජිනේරු - විදුලි - 2020 මාර්තු 02 දින

වෙනත් පුරප්පාඩු පිරවීමට උත්සාහ කළ අතර මැතිවරණය සහ COVID 19 වසංගතය පැතිරයාම හේතුවෙන් ඒවා පිරවීමට නොහැකි විය. අවශ්‍ය අවස්ථාවන්හිදී පුරප්පාඩු පිරවීම සඳහා පියවර ගනු ලැබේ.

**නිර්දේශය:**

පවතින පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුයි.